



# දකුණු ආසියාව
# 8 ශ්‍රේණිය
# තෙවන පාඩම



M.R.M. මාහර
කෑ/ දෙහි/ මියනවිට ක.වි.
දැරණියගල




පාකිස්ථානය
Pakistan
නේපාලය
Nepal
භූතානය
India
ඉන්දියාව
බංග්ලාදේශය
Maldives
මාලදිවයින
ශ්‍රීලංකාව






# දකුණු ආසියාවේ සුවිශේෂී බව

- ලොව උසම කන්ද වන එවරස්ට් පිහිටා තිබීම.




▶ අධික ශීතල සහ අධික උෂ්ණ ප්‍රදේශ දක්නට ලැබීම.





- ඝන වනාන්තර , තෘණ භූමි දක්නට ලැබීම.





# ▶ සුන්දරබාන් වගුරු බිම පිහිටා තිබීම.










# දකුණු ආසියා කලාපයේ සාපේක්ෂ පිහිටීම

- උතුරින් - හිමාල කඳු
- දකුණින් - ඉන්දියන් සාගරය
- නැගෙනහිරින්- බෙංගාල බොක්ක
- බටහිර- අරාබි මුහුද



# දකුණු ආසියාවේ නිරපේක්ෂ පිහිටීම

- සමකයේ සිට ( අංශක 0° )
  උතුරු අක්ෂාංශ 38°
- නැගෙනහිර දේශාංශ 60°
  – 100°




# දකුණු ආසියා කලාපයට අයත් රටවල් සහ අගනගර

- මා → මාලදිවයින
- ලහ → ලංකාව
- ඉන්නේ → ඉන්දියාව
- පාවෙන → පාකිස්ථානය
- භූතයෙක් → භූතානය
- නේ → නේපාලය
- බං → බංගලාදේශය


මාලේ
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටෙ
නවදිල්ලි
ඉස්ලාමාබාද්
තිම්පු
කත්මන්ඩු
ඩකා

මෙම රටවලට අමතරව නිකොබාර් දූපත් සහ අන්දමන් දූපත් ද දකුණු ආසියා භූගෝලීය කලාපයට අයත් වේ.


Kabul
Afghanistan
Islamabad
Lahore
Pakistan
Karachi
New Delhi
Nepal
Kathmandu
Thimphu
Bhutan
China
Ahmedabad
India
Kolkata
Dhaka
Bangladesh
Myanmar
Mumbai
Hyderabad
Bengaluru
Chennai
Sri Lanka
Colombo
Maldives
Malé
Indian Ocean
Your Free Templates
http://yourfreetemplates.com


Flags of countries of SOUTH ASIA
Bangladesh
Butane
Sri Lanka
India
Maldives
Nepal
Pakistan
VectorStock®
VectorStock.com/15441091

# සාර්ක් සංවිධානය




දකුණු ආසියානු රටවල් එකතු වී මෙම සංවිධානය පිහිටුවා ගෙන තිබේ.

මෙම සංවිධානයට ඇෆ්ගනිස්ථානය අයත් වුවද එය භූගෝලීය වශයෙන් අයත් වන්නේ මධ්‍යම ආසියවටය.



# පිළිතුරු සපයන්න

01.දකුණු ආසියා කලාපය සුවිශේෂී වීමට හේතු මොනවද?

02.දකුණු ආසියා කලාපයේ සාපේක්ෂ හා නිරපේක්ෂ පිහිටීම දක්වන්න.

03.දකුණු ආසියා කලාපයේ පිහිටුවා ඇති දේශපාලන සංවිධානය කුමක්ද?

04.දකුණු ආසියාවට භූගෝලීයව  අයත් නොවන එහෙත් සාර්ක් සංවිධානයට අයත් රට කුමක්ද?

05.දකුණු ආසියාවට අයත් රටවල් සහ අගනගර පිළිවෙළින් නම් කර ඒවා ලෝක සිතියමක ලකුණු කර දක්වන්න.

06. දකුණු ආසියා කලාපයට මායිම් වූ රටවල් 5 ක් දක්වන්න.

# මෙම සිතියමේ දක්වා ඇති රටවල් නම් කරන්න



# භූ දර්ශනය




යම් ප්‍රදේශයක පරිසරය හා ඒ මත ගොඩනැගුණු මිනිස් ක්‍රියාකාරකම් මගින් නිර්මාණය වූ සමස්ත භූ දර්ශනයයි.

# දකුණු ආසියානු කලාපයේ භූ දර්ශන

- කඳුකර
- නිම්න
- කාන්තාර
- කාර්මික සහ නාගරික
- වෙරළබඩ
- ග්‍රාමීය

# කඳුකර භූ දර්ශනය



මාල දිවයින හැර සෑම රටකම කඳුකර භූ දර්ශනය දක්නට ලැබේ.

විවිධ උසකින් යුතු කඳු පන්ති දක්නට ඇත.


සමක දේශගුණයේ සිට ධැව දේශගුණය දක්වා විවිධ දේශගුණ ලක්ෂණ පෙන්නුම් කරයි.

# දක්නට ලැබෙන කඳු පන්තීන්

කාරකෝරම් කඳු වැටිය





හින්දු කුෂ් කඳුවැටිය




වින්ධ්‍යා කඳුවැටිය




නැගෙනහිර සහ බටහිර ඝාට්ස්


# හිමාලය

# එවරස්ට්

හිමාල කඳු වැටිය මුහුදු මට්ටමේ සිට මීටර් 8000 ක් පමණ උසකට සහ කිලෝමීටර් 2500 ක් තරම් ප්‍රදේශයක පැතිර තිබේ.

ලොව උසම කඳු මුදුන් 14 න් 9 ක්ම මෙම භූ දර්ශනය තුළ දැකිය හැකිය.






# ජීවත්වන ජනවර්ග

- භූටියා
- කසා
- දර්ඩ්
- ලේප්චා
- ෂෙර්පා

## ෂෙර්පා



# හිමාලය ආශ්‍රිත ජනතාවගේ රැකියා

- සංචාරක කර්මාන්තය
- කෘෂි කර්මාන්තය
- කඳු නගින්නන්ට මඟ පෙන්වීම , භාණ්ඩ අලෙවිය
- බර උසුලාගෙන යාම
- රෙදි විවීම
- නූල් ගෙතීම



## නූල් ගෙතීම



## සංචාරක කර්මාන්තය



# ජීවන රටාව







- කෘෂිකර්මන්තය සහ සත්ත්ව පාලනය ප්‍රධාන ජීවන රටා වේ.
- වී, තිරිඟු,ඉරිඟු,මිලට්, එළවලු වර්ග වගා කරනු ලබයි.
- කඳු අතර පහත් බිම්වල හෙල්මළු වගාව සිදුකෙරේ.
- ගවයන් සහ බැටළුවන් ඇතිකරනු ලබයි.
- සතුන් දඩයම් කිරීම ද සිදු කෙරේ.

- හිම ක්‍රීඩා සහ සංචාරක කර්මාන්තය ද මෙහි කැපී පෙනේ.
- මිනිසුන්ගේ ශරීර ස්වභාවය ද කඳුකර පරිසරයට අනුව හැඩගැසී තිබේ.




- ශක්තිමත්, පැතලි, පුළුල් පතුල් සහිත පාද
- ශක්තිමත් බාහු
- අඩු ඔක්සිජන් වායුවෙන් ජීවත් වීමට සැකසුනු පෙනහළු





පහත වගුව සම්පූර්ණ කරන්න.

| හිමාල කඳුකරයේ භූ විෂමතා ලක්ෂණ | ජීවත්වන ජනවර්ග | මිනිසුන්ගේ ආහාර | රැකියා | වගාවන් |
|---|---|---|---|---|
| | | | | |
| | | | | |
| | | | | |
| | | | | |

# නිම්න භූ දර්ශනය

- ඉන්දියාවේ ගංගා ගංනිම්නය



# පාකිස්ථානයේ සින්ධු ගංගා නිම්නය





# ශ්‍රීලංකාවේ මහවැලි සහ කැළණි ගං නිම්නය





# ගංගා ගඟ ආශ්‍රිත නිම්න භූ දර්ශනය

- හිමාල කඳුකරයෙන් ආරම්භ වී කිලෝමීටර 2510 ක් පමණ දුර ගෙවා බෙංගාල බොක්කට ගලා බසී.
- ගඟ ආරම්භක අවස්ථාව කඳුකර භූ දර්ශනයට අයත් වේ.
- ගඟ දිගේ පහළට යනවිට ඌළිබිම් , හැඩපලු ගංගා , ගං දඟර , පිටාර තැනි , වැලිතලා දක්නට ලැබේ.
- තැනිතලා ප්‍රදේශයේ මීටර 200ට වැඩි උස බිම් ඇත්තේ කලාතුරකිනි.
- හින්දු බැතිමතුන්ගේ ශුද්ධ වූ ගංගා නදිය වන්නේ මෙයයි.
- විවධ භාෂා සහ ආගම් අදහන ජනයා මෙහි වාසය කිරීමෙන් සුවිශේෂී සංස්කෘතික භූ දර්ශන බිහි වී ඇත.

## හැඩපලු ගංගා



## ගං දඟර



# හින්දු ජන සංස්කෘතිය





දියළු පස පවතින ගංගා නිම්නය පුරා විවධ කෘෂි භෝග වගා කරනු ලබයි.

වී , තිරිඟු, උක් ඒ අතර ප්‍රධානය.

ගැඹුරු ළිං මගින් ජලය සම්පාදනය කර කපු , උක් වගා කෙරේ.

ගංගා නදියේ පහල ඩෙල්ටා ප්‍රදේශයේ පිහිටි සුන්දරබාන් වගුරු බිම ආශ්‍රිත ප්‍රධාන වගාව වන්නේ ජුට් ය.

කපු




ජුට්



- අධික ජන ඝනත්වයක් මෙම නිම්න කලාපය තුළ දැකිය හැකිය.
- දිල්ලිය, පැට්නා, කාන්පුර්, කල්කටා එවැනි ජනධික නගර වේ.
- මගී හා භාණ්ඩ ප්‍රවාහනයට බස් රථ , දුම්රිය හා ලොරි රථ යොදා ගනී.
- ගංගා නිම්නයේ පහළ කොටසේ අධික ජන පිඩනයක් පවතින අතර මේ නිසා ජලය අපවිත්‍ර වීම ගැටලුකාරී තත්වයක් බවට පත් වී තිබේ.





# පිළිතුරු සපයන්න

01.දකුණු ආසියානු කලාපිය සිතියමක ගංගා නම් ගඟ ඇද එහි අතු ගංගා ඇද දක්වන්න.

02. ගංගා ගං නිම්නයේ දැකිය හැකි භෞතික හූ විෂමතා ලක්ෂණ නම් කරන්න.

03. ගංගා ගං නිම්නයේ දැකිය හැකි සංස්කෘතික හූ දර්ශන මොනවාද?

# වෙරළබඩ භූ දර්ශනය

- දකුණු ආසියාව දිගු වෙරළ තීරයක් හිමි කලාපයකි.
- නේපාලය සහ භූතානය හැරුණු විට අනිකුත් සෑම රටකටම වෙරළ තීරයක් හිමිය.
- ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ වෙරළබඩ භූ දර්ශනය කැපී පෙනේ.
- මාලදිවයිනට දූපත් 1200 කට වැඩි ගණනක් හිමි අතර මින් දූපත් 200 ක පමණ ජනයා වාසය කෙරේ.
- කලපු, දූපත්, බොකු, කොරල්පර, තුඩු , කඩොලාන වෙරළබඩ භූ දර්ශනයේ කැපී පෙනෙන ෙභෟතික ලක්ෂණ වේ.

මාලදිවයින් වෙරළ තීරය

ශ්‍රී ලංකා වෙරළ තීරය





# වෙරළ භූ දර්ශනයේ කැපී පෙනෙන ආර්ථික රටා

- 01. ධීවර කර්මාන්තය
- 02. සංචාරක කර්මාන්තය

## ධීවර කර්මාන්තය

- වෙරළ තීරයේ ඇති කඩතොළු බව සහ නොගැඹුරු පටු මුහුදු තීරය ධීවර කටයුතු සඳහා යෝග්‍ය වේ.

- ධීවර කටයුතු ආශ්‍රිත ධීවර වරාය සංවර්ධනය වී ඇති අතර ඒ ආශ්‍රිත නගර සහ ගම්මාන ද සංවර්ධනය වී ඇත.

**ධීවර කර්මාන්තය ආශ්‍රිත මානුෂ ක්‍රියා**

මාළු වෙළඳාම

කරවල වේලීම.

මාළු ටින් කිරීම

උම්බලකඩ සෑදීම

විසිතුරු භාණ්ඩ නිපදවීම.








# සංචාරක කර්මාන්තය





- මෙම කලාපවල වර්තමානය වනවිට සංචාරක කර්මාන්තය දියුණුවට පත්වෙමින් පවතී.
- මේ සඳහා බලපා ඇති හේතුන් :
  - පැහැදිලි ජලය
  - දර්ශනීය සුදු වැලි තලා සහිත වෙරළ
  - කොරල්පර සහිත නොගැඹුරු මුහුද
  - හෝටල් පහසුකම්
  - සවාභාවික වරාය
  - ජෛව විවිධත්වය





# සංචාරක ප්‍රදේශ ආශ්‍රිත රැකියා

- හෝටල් ආශ්‍රිත රැකියා
- විසිතුරු භාණ්ඩ අලෙවිය
- ආයුර්වේද මධ්‍යස්ථාන
- සංචාරක මගපෙන්වන්නන්
- වෙළෙඳාම්
- වරාය ආශ්‍රිත රැකියා



# ශ්‍රී ලංකාවේ වෙරළාශ්‍රිත නගර

- ඔබ විසින් ශ්‍රී ලංකාවේ වෙරළාශ්‍රිත නගර ලංකා සිතියමක ලකුණු කර නම් කරන්න

# වෙරළ භූ දර්ශනයේ ජෛව විවිධත්වය

- කඩොලාන
- තෙත්බිම්
- වගුරු
- ශාක විශේෂ
- සත්ත්ව විශේෂ
- මත්ස්‍ය විශේෂ
- පක්ෂි විශේෂ





# වෙරළාශ්‍රිතව දැකිය හැකි ගැටළු

- අනවසර ඉදිකිරීම්.
- හිරිගල් කැඩීම්.
- වෙරළ ඛාදනය
- පරිසර දූෂණය
- අපද්‍රව්‍ය බැහැර කිරීම

# පිළිතුරු සපයන්න

- වෙරළ භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණ මොනවාද?
- සංචාරක කර්මාන්තය වර්ධනයට බලපා ඇති සාධක නම්කරන්න.
- ධීවර කර්මාන්තය ආශ්‍රිත ගොඩනැගී ඇති රැකියා මොනවාද?
- වෙරළ භූ දර්ශනයට අහිතකරව බලපාන මානුෂ ක්‍රියා මොනවාද

# ග්‍රාමීය භූ දර්ශනය



දකුණු ආසියාවේ බහුලවම දක්නට ලැබෙන භූ දර්ශනයයි.

කෘෂිකර්මාන්තය සහ ධීවර කර්මාන්තය පදනම්ව ගොඩනැගී ඇත.

ජන ඝනත්වය අඩුය.

ජනාවාස විවිධ රටා අනුව හැඩගැසී ඇත.

ලංකාවේ වියළි කලාපය ග්‍රාමීය භූ දර්ශනයට පැහැදිලි නිදසුනකි.

කෘෂිකර්මාන්තය මෙහි ප්‍රධානම ආර්ථික ක්‍රියාකාරකම වේ.

වී වගාව ප්‍රධාන ආර්ථික භෝගය වේ.

වී වගා කළ නොහැකි උස බිම්වල හේන් වගා කෙරේ.




හේන්වල ධාන්‍ය වර්ග එළවලු , පලතුරු ආදිය වගා කෙරේ.

සත්ත්ව පාලන කටයුතු ද දක්නට ලැබේ.

වාරිමාර්ග කටයුතු සහ ජල සම්පාදන ව්‍යාපාර ආශ්‍රිත සැලසුම් සහගත නගර ඉදිවීම ග්‍රාමීය භූ දර්ශනය වෙනස්වීමට හේතු වී ඇත.




ගල්ඔය , උඩවලව , මහඔය වැනි සංවර්ධන ව්‍යාපාර අරඹා ඇත්තේ වියළි කලාපයේය.

අනුරාධපුර , පොලොන්නරුව වැනි පුරාණ නගර ද මෙම කලාපය තුළ දක්නට ලැබේ.

# පිළිතුරු සපයන්න.

- 01. ග්‍රාමීය භූ දර්ශනයේ දක්නට ලැබෙන ආර්ථික කටයුතු සඳහන් කරන්න.

- 02. ශ්‍රී ලංකාවේ වියළි කලාපය තුළ දක්නට ලැබෙන සංවර්ධන ව්‍යාපාර මොනවාද?

- 03. ග්‍රාමීය භූ දර්ශනය වෙනස් වෙමින් පැවතීමට හේතු මොනවාද?

# කාර්මික සහ නාගරික භූ දර්ශනය

- මුම්බායි , දිල්ලිය, චෙන්නායි, කල්කටා , කරච්චිය සහ කොළඹ වැනි නගර ආශ්‍රිතව මෙම භූ දර්ශනය දක්නට ලැබේ.

- මෙම ප්‍රදේශ තුළ මිනිසා විසින් ඉදිකරන මාර්ග ජාල , සන්නිවේදන ජාල , වාසස්ථාන සහ පරිපාලන මධ්‍යස්ථාන බහුලය.

- මේ හේතුවෙන් ජනයා බහුලව නගර කරා සංක්‍රමණය වේ.






මුම්බායි ඉන්දියාවේ දෙවන විශාලතම නගරය වේ.

නිවාස ඝනත්වය ඉතා අධිකය. සිරස්ව ව්‍යාප්තව ඇත.

සීමිත භූමියක අධික ජන සංඛ්‍යාවක් වාසය කරති.

කර්මාන්ත සහ සේවා කටයුතු වර්ධනය වී ඇත.

සැලැස්මකින් තොරව ඉදි වූ අඩු පහසුකම් සහිත ජනාවාස විශාල ලෙස ඇත.



# නාගරික භූ දර්ශනය ආශ්‍රිත ගැටළු

- 01. විදි ජනයා බහුල වීම.
- 02. අපචාර බහුල වීම.
- 03.මාර්ග තදබදය






- 04. අඩු ආදායම් ජනාවාස බහුල වීම.
- 05. පරිසර දූෂණය
- 06. ඉඩම් හිඟය





# පිළිතුරු සපයන්න

- 01.දකුණු ආසියා කලාපීය සිතියමක කාර්මික සහ නාගරික භූ දර්ශනයට නිදසුන් වන නගර 5ක් ලකුණු කරන්න.

- 02.මුම්බායි නාගරික භූ දර්ශනයේ කැපී පෙනෙන ලක්ෂණ නම් කරන්න.

- 03.නාගරික භූ දර්ශනය ආශ්‍රිත ගැටළු මොනවාද?

# කාන්තාර භූ දර්ශනය

- තාර් කාන්තාරය ආශ්‍රිතව මෙම භූ දර්ශනය හඳුනාගත හැකිය.

- ඉන්දු පාකිස්තාන් දේශ සිමාවේ රාජස්ථාන් ප්‍රාන්තයේ මෙය පිහිටා තිබේ.



# තාර් කාන්තාරය ආශ්‍රිත දැකිය හැකි භෞතික ලක්ෂණ

- වැලිතලා සහිත පැතිරුණු භූමිය
- මිලිමීටර 250 ට අඩු වර්ෂාව
- අධික වාෂ්පීකරණය
- අධික උෂ්ණත්වය
- වියළි සුළං
- පසේ තෙතමනය අඩුවීම



- තාර් කාන්තාරය විශාල ලෙස පැතිරුණු භූගත ජලධරයක් ඇති ප්‍රදේශයකි.

- මේ නිසා සමහර ශාක වර්ග පොළවේ ගැඹුරට මුල් විහිදුවා ජලය උරා ගනී.

- ගැඹුරු ළිං මඟින් භූගත ජලය ප්‍රයෝජනයට ගෙන වගා කටයුතු කරනු ලබයි.

- ජල උල්පත් සහිත ක්ෂේම භූමිවල ජනයා ඒකරාශී වී ඇත. උක් කපු මිලට් මේ ආශ්‍රිතව වගා කෙරේ.





සත්ත්ව පාලනය ප්‍රධාන ආර්ථික කටයුත්තයි

භාණ්ඩ ප්‍රවාහනයට ඔටුවා යොදා ගනී.

නිවාසවල පරිසරයට අනුව වර්ණ ආලේප කර ඇත.

සත්ත්ව පාලනයට අධිකව තෘණ භාවිතය නිසා භූමිය නිසරු වී ඇත.






# පිළිතුරු සපයන්න

- තාර් කාන්තාරය ලෝක සිතියමක ලකුණු කර දක්වන්න.
- භෞතික පරිසරයට මෙහි ජනතාව හැඩගැසී ඇත්තේ කෙසේදැයි කරුණු දෙකකින් දක්වන්න.
- මෙම භූ දර්ශනය තුළ කැපී පෙනෙන ලක්ෂණ සඳහන් කරන්න.

